Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/

# බටහිර සංගීතය

## *මධ්‍යමය සහ පංචමය ශ්‍රැති කර ගනිමින් සප්තක නිර්මාණය කරමු*

❖ scale නිර්මාණය

බටහිර සංගීත පද්ධතිය තුළ පවතින න්‍යායාත්මක වූ මූලික සිද්ධාන්තයකි scale.

scale යනු යම් ශෘති ස්වරයක සිට හඬ අනුපිළිවෙලින් ස්වර පෙළ ගැස්වීමයි.


බටහිර සංගීතයේ ප්‍රධාන scale වර්ග දෙකකි.

1 Major scale


2 Minor scale

ස්කේලයක tone සහ Semitone අතර පරතරයන්ගේ අනුපිළිවෙල අනුව scale සාදා ගත හැකිය

Semitone එකක් යනු සප්තකයේ ස්වර දොළසේ ළඟම ස්වර දෙකක් අතර ඇති දුරයි. එය අර්ධ ස්වරයක් ලෙස හඳුන්වයි





Tone එකක් යනු සම්පූර්ණ ස්වරයකි. Semitone දෙකක් එකතු වී tone එකක් නිර්මාණය වේ.




**උදාහරණ**

## Major scale එකක ස්වර පරතරය



මෙම ක්‍රමයට අමතරව  major scale එකක්  සාදා ගන්නා ආකාරය පහත දැක්වේ

Major scale එකක ස්වර අන්තරයන් පහසුවෙන් ලබාගත හැකි scale එක  C scale එකයි

- මුලින්ම  C scale යෙ  ස්වර දොලස පිළිවෙලින්  ලියාගන්න

  C  $C^{\#}$  D  $E^{b}$  E  F  $F^{\#}$  G  $A^{b}$  A  $B^{b}$  B

- පසුව එම ස්වර එකේ සිට 12 දක්වා අංක කරගන්න

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| C | $C^{\#}$ | D | $E^{b}$ | E | F | $F^{\#}$ | G | $A^{b}$ | A | $B^{b}$ | B |
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 |

- ඉන්පසුව එම ස්කේලයේ ශුද්ධ ස්වරයන්ට අදාල ඉලක්කම් සලකුණු කරගන්න

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| C | $C^{\#}$ | D | $E^{b}$ | E | F | $F^{\#}$ | G | $A^{b}$ | A | $B^{b}$ | B |
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 |

දැන් අපට ලැබී ඇත්තේ Major scale එකකට  අදාළ ඉලක්කම් ය

මෙම  1 , 3,  5,  6,  8,  10,  12  ඉලක්කම් භාවිතයෙන් අපට ඕනෑම Major scale එකක් සාදාගත  හැකිය

**උදාහරණ**

## <u>මධ්‍යම භාවයෙන් ශුද්ධ ස්වර සප්තකය (F major scale )නිර්මාණය කරමු</u>

මුලින්ම පෙර පරිදි C ස්වරයේ සිට ස්වර දොලස පිළිවෙලින් ලියාගන්න

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| C | $C^{\#}$ | D | $E^{b}$ | E | F | $F^{\#}$ | G | $A^{b}$ | A | $B^{b}$ | B |

දෙවනුව F ස්වරය මූලික ස්වරය කරගනිමින් එය අංක එක යොදා පිළිවෙළින් ස්වර දොළස යොදන්න

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| C | $C^{\#}$ | D | $E^{b}$ | E | F | $F^{\#}$ | G | $A^{b}$ | A | $B^{b}$ | B |
| 8 | 9 | 10 | 11 | 12 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |

දැන් අපි මුලින් සොයා ගත් major scale ඒ ට අදාළ ඉලක්කම් මෙහි සලකුණු කරන්න

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| C | $C^{\#}$ | D | $E^{b}$ | E | F | $F^{\#}$ | G | $A^{b}$ | A | $B^{b}$ | B |
| (8) | 9 | (10) | 11 | (12) | (1) | 2 | (3) | 4 | (5) | (6) | 7 |

සලකුණු කරගත් ඉලක්කම් වලට ලැබී ඇති ස්වර F major scale එකේ එකට අයිති ස්වරයන් වේ

ඉන්පසුව සලකුණු කර ගත් අංක වලට අදාළ ස්වර පිළිවෙලට ලියූ විට අපට ලැබෙනුයේ F major scale එකට අදාළ ස්වර සප්තකයයි

F G A $B^{b}$ C D E

මෙහිදී අපට විකෘති සුරයක් ලෙස බී ප්ලැට් ( $B^{b}$) දැකිය හැකිය

අපි තවත් උදාහරණයක් බලමු

**<u>කෝමළ නිශාදය ශෘති ස්වරය කරගනිමින් $B^b$ major scale සප්තකයක් නිර්මානය කරමු</u>**

මුලින්ම C ස්වරයේ සිට ස්වර 12 පිළිවෙලින් ලියන්න

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| C | $C^\#$ | D | $E^b$ | E | F | $F^\#$ | G | $A^b$ | A | $B^b$ | B |

දැන් **$B^b$** ස්වරය මූලික ස්වරය කරගනිමින් 1 සිට 12 දක්වා පහත් පරිදි අංක කරගන්න

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| C | $C^\#$ | D | $E^b$ | E | F | $F^\#$ | G | $A^b$ | A | $B^b$ | B |
| 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 1 | 2 |

ඉන්පසුව මුලින් සොයාගත් major scale එයට අදාළ අංක මෙහි රවුම් කර ගන්න

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| C | $C^\#$ | D | $E^b$ | E | F | $F^\#$ | G | $A^b$ | A | $B^b$ | B |
| **3** | 4 | **5** | **6** | 7 | **8** | 9 | **10** | 11 | **12** | **1** | 2 |

දැන් සලකුණු කර ගත් අංකවලට වලට අදාළ ස්වර පිළිවෙලට ඛිය වූ විට අපට ලැබෙනුයේ $B^b$ major scale එකට අදාළ ස්වර සප්තකය

$B^b$ C D $E^b$ F G A

මේ ආ ආකාරයට සප්තකයේ ස්වර 12 ටම අදාලව major scales 12 සාදාගත් හැකි වේ

**<u>පැවරුම්</u>**

1 පංචමය ශ්‍රැති ස්වරය කරගනිමින් සප්තකය (G major scale) නිර්මාණය කරන්න

2 E flat ($E^b$) major scale එක නිර්ර්මණය කරන්න

3 විකෘති ස්වර එකක් පමණක් යෙදෙන major scale කීයද ?